25-06-2024 උදෑසන මුරලි ඕම් ශාන්ති බාප්දාදා මධුබන්

**සාරය:** සුමිහිරි දරුවනි, ඔබ සෑම කෙනෙක්ම ජීවාත්මයක් යන විශ්වාසය හොඳින් තබා ගන්න. ඔබ යම් කිසි කාර්යක් ආරම්භ කරන විට තමන් ජීවාත්මයක් යන සිතිවිල්ල මත එය ආරම්භ කළ හොත් ඔබ එය කරන්නේ බාබාගේ සිහියේ හිඳිමින් නිසා පාප කිසිවක් සිදු නොවනු ඇත.

**ප්‍රශ්නය:** ඔබගේ කර්මක්ෂය තත්ත්වය කරා ළඟා වීම සඳහා ඔබ විසින් කළ යුතු උත්සාහය කුමක්ද ? ඔබ ඔබගේ කර්මක්ෂය තත්ත්වය කරා ළඟා වනවා යැයි කිව හැක්කේ කෙසේද ?

**පිළිතුර:** කර්මක්ෂය (කර්මාතීත්) තත්ත්වය කරා ළඟා වීම සඳහා ස්මරණයේ බලය ලබාගෙන ඔබගේ ඉන්ද්‍රිය පාලනය කිරිමට උත්සාහ ගන්න. මම, මේ අශාරිරික ජීවාත්මය ඒ අශාරිරික පියාගේ දරුවෙක් යන පුහුණුව නිරන්තරයෙන් තබා ගන්න. ඔබගේ සියලුම ඉන්ද්‍රියන් පාපයෙන් තොර විය යුතුයි. මෙය තමයි ඔබ විසින් යෙදිය යුතු හොඳම උත්සාහය. ඔබ ඔබගේ කර්මක්ෂය තත්ත්වයට පත්වෙන විට ඔබගේ සෑම ඉන්ද්‍රියක්ම සුවඳවත් වෙන්නටත් සහැල්ලු බවටත් පත්වෙනවා. ඒ කිසිම ඉන්ද්‍රියක් පාපයෙහි ගන්ධයට හසුවන්නේ නැහැ. ඔබ මෙවැනි තත්ත්වයකට පත් වුවහොත් පමණයි ඔබට අතීන්ද්‍රිය සතුට අත්දැකිය හැක්කේ.

ඕම් ශාන්ති. බාබා ඔබ අමතනවා. දරුවනි, මොහු කා හටද කතා කරන්නේ යන්න ඔබට කිව යුතු දෙයක් නොවෙයි. දරුවන් වන ඔබ තේරුම් ගන්නවා ශිව බාබා තමයි ඥාන සාගරය කියලා. ඔහු තමයි මෙම මනුෂ්‍ය ගසෙහි බීජය. එමනිසා, ඔහු අනිවාර්යෙන්ම මෙම ජීවාත්මයන් හට කතා කළ යුතුයි. දරුවන් තේරුම් ගන්නවා මේ ඔවුන් හට උගන්වන්නේ ශිව බාබා කියලා. අපි 'බාබා' යන වචනය පාවිච්චි කරන විට අපි දන්නවා ඉන් අදහස් කරන්නේ ඒ උත්තරීතර ජීවය බාබා බව. සෑම මනුෂ්‍යයෙක්ම, ඒ උත්තරිතර ජීවය පියා ලෙස හඳුන්වනවා. බාබා වාසය කරන්නේ පරම්දාම්හියි. මෙවැනි කරුණු යටින් ඔබ ඉරක් ගසා ගත යුතුයි. ප්‍රථමයෙන් ඔබ ජීවයක් බව දැනගෙන ඒ පිළිබඳ හොඳ විශ්වාසයක් ඇති කර ගන්න. දරුවන්ගේ ජීවාත්මයට තමයි බාබා විසින් පවසනු ලබන සියලු දේ හොඳින් උරා ගනු ලබන්නේ. ඒ උත්තරීතර ජීවය තුළ තිබෙන ඥානය අනිවාර්යෙන්ම ඔබගේ ජීවය තුළටත් ඇතුල් විය යුතුයි. ඉන් පසු ඔබගේ මුඛය යොදාගෙන ඔබට පුළුවන් අන් අයටත් මෙම ඥානය ලබා දෙන්න. මෙහි සිදුවන ඕනෑම ඉගැන්වීමක දී ජීවාත්මය තමයි ඒ සියලුම දේ ඉගෙන ගනු ලබන්නේ. ජීවයක් එම ශරීරය අතහැර ගිය පසු එම ජීවය මෙම ඥානය පිළිබඳව කිසිම දෙයක් දන්නේ නැහැ. ජීවාත්මය එහි සියලු සංස්කාරත් රැගෙන ගොස් තවත් ශරීරයක් ලබා ගන්නවා. එමනිසා, ඔබ තුළ හොඳ අවබෝධයක් තිබිය යුතුයි ඔබ ජීවයක් බව. ඔබ දැන් සියලු ශරීර අවධානයන් නවතා දැමිය යුතුයි. ඔබගේ ජීවය තමයි මෙම කරුණු වලට හොඳින් සවන් දී ඒවා ධාරණය කර ගත යුත්තේ. ශරීරයකට ජීවයක් නැති නම් අඩුම තරමේ එම ශරීරයට සෙලවීමටවත් හැකියාවක් නැහැ. දරුවනි, ඔබට දැන් ස්ථිර විශ්වාසයක් තිබිය යුතුයි ඔබට මෙම ඥානය දෙන්නේ ඒ උත්තරීතර ජීවය විසින් බවත් එම ඥානය ඔහු විසින් දෙනු ලබන්නේ මෙම ශරීරය මාර්ගයෙන් බවත් ඔබ එයට සවන් දෙන්නේ මෙම ශරීරයෙන් බවත්. නමුත් ඔබ නැවත නැවතත් මෙය අමතක කරමින් නොයෙකුත් ශරීරධාරීන් සිහි කරමින් සිටිනවා. ඒ වගේම ඔබ දන්නවා. හොඳ මෙන් නරක සංස්කාරත් මෙම ජීවය තුළ ගැබ්ව තිබෙන බව. නොයෙකුත් මත් ද්‍රව්‍ය පාවිච්චියත්, නරක වචන පාවිච්චි කිරීමත් සිදු වන්නේ මෙම භෞතික ඉන්ද්‍රියන් නිසයි. ජීවයක් එහි කොටස රඟපාන්නේ මෙම ඉන්ද්‍රිය මාර්ගයෙන්. පළමුවෙන්ම ඔබ අනිවාර්යෙන්ම ජීවාත්ම අවධානයට පත් වී සිටිය යුතුයි. බාබා උගන්වන්නේ ඔබගේ ජීවයටයි. එමනිසා, අවසානයේ ඔබගේ ජීවය තුළ තමයි මේ සියලුම ඥානය රැඳී තිබෙන්නේ. ඒ උත්තරීතර ජීවය මේ ඥානයත් සමඟ එහි වෙසෙනවා මෙන්ම ඔබත් මෙම ඥානය සමඟ ඔබගේ ජීවිතය ගෙන යා යුතුයි. දරුවනි, මම ඔබ නිවස බලා ගෙන යන්නේ මෙම ඥානයත් සමඟයි. ඉන් පසු ඔබගේ කොටස රඟපෑම සඳහා නැවතත් මෙම විශ්ව වේදිකාව මතට පැමිණිය යුතුයි. ඒ නව ලෝකයේ ඔබගේ තිළිණය අත් දැකීම තමයි ඔබ විසින් රඟ පෑ යුතු කොටස. එවිට මෙම ඥානය පිළිබඳ සියලු දේ ඔබට අමතක වි යනවා. ඔබ මේ සියලු දේ පැහැදිලිව තේරුම් ගෙන ඒවා හොඳින් ධාරණය කර ගත යුතුයි. ප්‍රථමයෙන්ම ඔබ ජීවයක් බව හොඳින් තේරුම් ගන්න. මෙය අමතක කරන බොහෝ දෙනා සිටිනවා. ඔබ මේ සඳහාම විශේෂ උත්සාහයක් දැරිය යුතුයි. මද හෝ උත්සාහයක් දරන්නේ නැතිව ඔබට මෙම ලෝකයේ පාලකයන් බවට පත්විය නොහැකියි. මෙම ඥානය අළුත් ඥානයක් නිසා නැවත නැවතත් අමතක කර දමනවා. ඔබ ජීවයක් බව ඔබ විසින් අමතක කළ විගසම ඔබ විසින් මොනයම් හෝ ආකාරයක පාපයක් සිදු

කිරීමට ඔබ පෙළඹෙනවා. නමුත් ඔබ ජීව අවධානයට පත් වූ කළ ඒ සියලු පාපයන්ගෙන් ඔබ මිදෙනවා ඔබගේ පාපයන් සියල්ලම විනාශ වී යනවා. ඉන් පසු කල්ප භාගයක් යන තුරුත් ඔබ විසින් කිසිදු පාපයක් සිදු කරන්නේ නැහැ. එමනිසා, මෙම ඉගෙනීම ලබන්නේ ඔබගේ ජීවය මිස මෙම ශරිරය නොවන බව හොඳින් විශ්වාසය තබා ගන්න. මුලදී නම් ඔබට මනුෂ්‍යයන් මඟින් නොයෙකුත් ආකාරයේ උපදෙස් ලබා ගැනීමට සිදු වූවා. නමුත් දැන් ඔබ ශ්‍රීමත් ලබන්නේ බාබාගෙන්. මේ නව ලෝකය සඳහා වූ ඥානය සම්පූර්ණයෙන්ම අළුත් වූ ඥානයක්. ඔබ සියලු දෙනා නවතාවයකට පත් වෙනවා. මේ ගැන කිසිම ලෙසකින් කලබල වීමට අවශ්‍ය නැහැ. බොහෝ අවස්ථාවල දී ඔබ මෙසේ නවතාවයෙන් පැරණි බවටත් පැරණි බවින් නවතාවයටත් පත් වී තිබෙනවා. එමනිසා, දැන් හොඳින් උත්සාහ කරන්න. ඔබ ජීවාත්මයක්, ඒ වගේම මෙම ඉන්ද්‍රිය මාර්ගයෙන් මා මාගේ කොටස රඟපානවා යන විශ්වාසය හොඳින් තබා ගන්න. ඔබගේ කාර්යාලයේ දී පවා ඔබ ජීවාත්මයක් මෙම ශරීරය මාර්ගයෙන් මා මාගේ කොටස රඟපානවා යන සිහි බුද්ධියෙන් සිටිය හොත් ඔබට උගන්වන ඒ එකම පියාගේ සිහියේ සිටීම අපහසු කාර්යයක් වෙන එකක් නැහැ. ඔබගේ ජීවාත්මය තමයි බාබා සිහිපත් කරන්නේ. මුලදී නම් ඔබ කියමින් සිටියා අපි සිහි කරන්නේ ඒ අශාරීරික දෙවියන් කියා. නමුත් ඔබ එසේ ඒ අශාරීරික දෙවියන් සිහි කරද්දී ඔබ සිතුවේ ඔබ ශාරීරික අය යනුවෙනුයි. ඔබ ඒ අශාරීරික දෙවියන් සිහි කරන කිසිම අවස්ථාවක සිතුවේ නැහැ ඔබත් එවැනිම අශාරීරික අයෙක් කියා. නමුත් දැන් ඔබත් අශාරීරික ජීවාත්මයක් ලෙස සිතා ඒ අශාරීරික පියාණන් සිහි කරන්න. ඔබ බොහොම ප්‍රවේසමෙන් මේ සියලු දේ නැවත නැවතත් ආවර්ජනය කර බැලිය යුතුයි. සමහරු සටහන් පවත්වා ගනිමින් කියනවා ඔවුන් පැය දෙකක් තිස්සේ ස්මරණයේ යෙදුනා කියා. සමහරු කියනවා. ඔවුන් නිරන්තරයෙන් ශිව බාබා සිහි කරනවා කියා. කොහොමනමුත්, කිසිම කෙනෙක් හට සෑම විටම ශිව බාබා සිහි කළ නොහැකියි. ඔබට මෙසේ කළ හැකි නම් ඒ කියන්නේ දැනටමත් ඔබ ඔබගේ කර්මක්ෂය තත්ත්වයට පත් වී ඇත යන්නයි. නමුත් ඔබගේ කර්මාක්ෂය (කර්මාටීත්) තත්ත්වය කරා යාමට නම් ඔබ බොහෝ සෙයින් උත්සාහ දැරිය යුතුයි. ඔබට එවැනි තත්ත්වයක් තිබෙන විට ඔබගේ සියලු පාපකාරී ඉන්ද්‍රියන් ඔබගේ පාලනය යටතේ තබා ගත හැකියි. සත් යුගයේ දී නම් ඔබගේ සියලු ඉන්ද්‍රියන් පාපයෙන් තොරයි. එහිදී ඔබගේ ඉන්ද්‍රියන් සියල්ලන්ම සුවඳ විහිදවනවා. නමුත් දැන් නම් ඔබගේ ඉන්ද්‍රියන් සියල්ලම අපිරිසිදු වන අතර ඉන් හමන්නේ දුගඳක් පමණයි. සත් යුගයේ ප්‍රශංසනීයත්වය ඉතාමත් ආදරණීයයි. එය හඳුන්වන්නේ දිව්‍යලෝකය, නව යුගය, පාරාදීසය යන නම් වලින්. එහිදී ඔබ තුළ ඇතිවන ලක්ෂණ හෝ ඔබ විසින් පළඳිනා ඔටුණු මෙහි කිසිම අයෙක් හට නිර්මාණය කළ නොහැකි අලංකාර වත් දේවල් වනවා. ඔබ සුක්ෂම දනව්වට මේවා ගැන දර්ශන ලැබුවත් ඒවා මෙහි නිර්මාණය කිරීමට ඔබට බැහැ. එහි තිබෙන්නේ ස්වභාවික සෞන්දර්යයක්. එමනිසා දරුවනි, ඔබ දැන් මෙම ස්මරණය මඟින් පාරිශුද්ධත්වය කරා ළඟා විය යුතුයි. ඔබ මෙම ස්මරණය නැමැති වන්දනා ගමන මත හැකි තරම් කාලය ගත කළ යුතුයි. මේ සඳහා ඔබ විසින් හොඳ උත්සාහයක් දැරිය යුතුයි. බාබා සිහි කිරීම මඟින් ඔබගේ කර්මක්ෂය තත්ත්වය කරා ළඟා වී ඔබගේ සියලු ඉන්ද්‍රියන් සැහැල්ලු කර ගන්න. එවිට සෑම ඉන්ද්‍රියක්ම සුවඳවත් වන අතර කිසිම දුගඳක් හමන්නේ නැති තත්ත්වයට එය පිරිසිඳු වෙනවා. දැන් නම් සෑම ඉන්ද්‍රියක්ම අපිරිසිඳු තත්ත්වයක තිබෙන නිසා ඉන් දූර්ගන්ධයක් තිබෙනවා. මෙම ශරීරයෙන් කිසිදු ප්‍රයෝජනයක් නැහැ. ඔබගේ ජීවාත්මය දැන් පිරිසිඳු වෙනවා. නමුත් ඔබගේ ශරීරය නම් මෙහිදී පිරිසිඳු වීමට නොහැකියි. ඔබට නව ශරීරයක් ලැබුණ හොත් නම් එසේ විය හැකියි. එවිට සෑම ඉන්ද්‍රයකින්ම විහිදෙන්නේ සුවඳක්. මෙය තමයි දේවී දේවතාවන්ගේ ප්‍රශංසනීයත්වය. දරුවනි, ඔබ දැන් විශාල සතුටක් අත් දැකිය යුතුයි. බාබා පැමිණ සිටින්නේ ඔබගේ සන්තෝසය වැඩි දියුණු කිරීමටයි. බාබා කියනවා මා සිහි කරන්න. එවිට ඔබගේ සියලුම පාපයන් විනාශ වී යයි. මෙම වචන කාණ්ඩය ගීතාවේ ඉතා පැහැදිලි ලෙස පෙන්වා දි තිබෙනවා. බාබා කියා තිබෙනවා ගීතාව අධ්‍යයනය කරන මගේ භක්තිවන්තයින් ක්‍රිෂ්ණාගේ භක්තිවන්තයින් වෙනවා. මේ නිසා තමයි බාබා කියන්නේ මේ සෑම දෙයක්ම ඔබ කිව යුත්තේ දේවතාවන් වන්දනා කරන වන්දනාකරුවන්ටයි. ඔවුන් ශිවා වන්දනා කළත් ඔවුන් කියනවා, ඔහු සෑම තැනම සිටිනවා කියා. ඔවුන් ශිවා අප්‍රසිද්ධියට ලක් කරන නමුත් නිති පතා කෝවිල් ගොස් ඔහු වන්දනා කරනවා. ශිවා වෙනුවෙන් තනා ඇති කෝවිල් කරා ගණන් කළ නොහැකි තරම් මිනිසුන් යනවා. ඔවුන් ඉතා අපහසු පියවර නගිමින් තමයි එහි ඇතුල් විය යුත්තේ. ශිවාගේ කෝවිලක් සෑම විටම තනන්නේ උස් ස්ථානයකයි. ශිව බාබා තමයි ඉනිමඟෙහි පින්තූරය ඔබට හඳුන්වා දුන්නේ. ඔහුගේ නමත් ඉතාමත් උසස් නාමයක් වනවා මෙන්ම ඔහුගේ වාසස්ථානයත් තිබෙන්නේ බොහොම ඉහළිනුයි. බද්‍රිනාථ හා අමරනාථ යන දේවාල කරා මිනිසුන් යන විට ඉතාමත් අපහසු වූ පියවර නඟිමින් තමයි ඔවුන් එහි ඇතුල් විය යුත්තේ. ඔබ උසස් තත්ත්වයකට පත් කරවන්නේ ඔහු නිසා ඔහු වෙනුවෙන් තනා ඇති කෝවිල් ආදියත් තනා ඇත්තේ උස් ස්ථාන වලයි. නීතියට

අනුව ශිවා වෙනුවෙන් තනන කෝවිල් තැනිය යුත්තේ නගර වලයි. කොහොමනමුත්, මිනිසුන් මෙම උස් ස්ථාන කරා යද්දී විඩාවට පැමිණෙන නිසා ඔවුන්ගේ නිවෙස් වලට ඔවුන් පූජාසනයක් තනා ගන්නවා. කෙසේවෙතත්, ඔහුව උසස් තැනැත්තා ලෙස සළකන ඔවුන් සැම විටම එය තනනු ලබන්නේ උස් ස්ථානයකයි. මෙහිදීත් ගුරු ශිඛර සඳහා තනනු ලබන කෝවිල තනනු ලබන්නේ උස් කඳු මතයි. ඒ උසස්ම වූ පියා දැන් ඔබට මේ සියලු දේ විස්තරකර දෙනවා. මිනිසුන් කියනවා, ඔහු සැම තැනකම ඉන්න කෙනෙක් කියලා. ඔබගේ ඉලක්කයත් අරමුණත් ඔබගේ ඉදිරියෙහි තිබෙනවා. බාබා හැර වෙන කිසිම පුද්ගලයෙකුට මෙවැනි ඉලක්යක් හා අරමුණක් ඔබට ලබාදිය නොහැකියි. ඔබ දැන් ඒ සත්‍ය නාරායන්ගේ සත්‍ය කතාන්දරයට සවන් දෙද්දී අනෙක් මිනිසුන් අතීතයේ සිදු වූ නොයෙකුත් කතාන්දර කියමින් සිටිනවා. මෙය බාබා හඳුන්වන්නේ කතාන්දරයක් ලෙසයි. මේ උසස්තම පියා තමයි ඔබට ඒ උසස්ම වූ කතාව පවසන්නේ. මෙම කතාවට සවන් දීමෙන් තමයි ඔබ උසස් තත්ත්වයකට පත් වන්නේ. ඔබ මෙම කතාවට සවන් දී තවත් බොහෝ දෙනෙකුට මෙම කතාව පැවසිය යුතුයි. ඒ සඳහා ඔබ ප්‍රදර්ශන පැවැත් විය යුතුයි. මීට අවුරුදු 5000කට ප්‍රථම භාරතය පමණක් තිබුණු කළ මෙය දේවී දේවතාවන්ගේ රාජ්‍යයක්. මෙය තමයි වෙන කිසිම අයෙක් හට පැවසිය නොහැකි එකම සත්‍ය කතාන්දරය. බාබා, මෙම ගසේ ජීවාත්මක බීජය වන ඔහු විසින් පවසන මෙම සත්‍ය කතාන්දරය මඟින් පමණයි ඔබට දේවී දේවතාවන් බවට පත්විය හැක්කේ. මේ සඳහා අවශ්‍ය පළමුවන කාරණය තමයි පාරිශුද්ධත්වය. ඔබ පාරිශුද්ධත්වයට පත්වන තුරු ඔබට මෙම ඥානය හොඳින් ධාරණය කර ගත නොහැකියි. සිංහ රජිනකගේ කිරි දමා තැබීමට අවශ්‍ය නම් ඒ සඳහා අවශ්‍ය වන්නේ එවැනිම වූ රන් බඳුනකි. ඒ කිරි එරෙන්නේ එවිටයි. ඔබේ කන් බඳුනක් වැනියි. ඒවා රන් බඳුන් බවට පත්විය යුතුයි. නමුත් දැන් නම් ඒවා ගල් බවට පත් වී තිබෙන්නේ. ඒවා රන් බවට පත් වූ විට පමණයි මෙම ඥානය හොඳින් ධාරණය කර ගත හැක්කේ. මෙයට සවන් දෙන විට ඔබ හොඳම අවධානයකින් එයට සවන් දුන හොත් පමණයි එය හොඳින් ධාරණය කර ගත හැකි වන්නේ. ගීතාවේ ලියා ඇති කතාවත් තේරුම් ගැනීම ඉතා පහසු දෙයක්. මිනිසුන් අන් අයට මෙම කතාව කීමෙන් මුදල් උපයා ගන්නවා. එම කතාවට සවන් දෙන අයත් ඔහුට මුදල් දෙනවා. මෙහිදී ඔබත් එවැනිම වූ ආදායමක් ලබනවා. මෙම ආදායම් දෙකම ලැබෙන්නේ එකම අවස්ථාවේදියි මේ දෙකම ව්‍යාපාරයන් දෙකක්. බාබා ඔබට කියන්නේ මන්මනාභව් වීමටත් පාරිශුද්ධත්වයට පත්වීමටත්ය. වෙන කවුරු කිව්වත් ඔබට මෙසේ මන්මනාභව් තත්ත්වයට පත්විය නොහැකියි. මෙහි සිටින කිසිම මනුෂ්‍යයෙකුට සම්පූර්ණයෙන්ම පාරිශුද්ධත්වයට පත් විය නොහැකියි. මන්ද, ඔවුන් සියලුම දෙනා උපත ලබා ඇත්තේ පාපයෙන් නිසයි. මෙම කලි යුගය අවසන් වන තුරුම රාවන්ගේ රාජ්‍යය පැවතෙනවා. නමුත් ඔබ මෙහිදී, ඔබට හැකිතාක් දුරට පාරිශුද්ධත්වයට පත්විය යුතුයි. සාමාන්‍ය මනුෂ්‍යයන් නොව දේවී දේවතාවන් තමයි පිරිසිදු අය ලෙස හඳුන්වන්නේ. සන්යාසීන් පවා මනුෂ්‍යයන් පමණයි. ඔවුන්ට ඇත්තේ හුදකලා මාර්ගයක්. බාබා කියනවා මා සිහි කරන්න. එවිට ඔබ හට පුළුවන් පාරිශුද්ධත්වයට පත්වන්න. ගෘහ ජීවිතයේ සිටම ආධ්‍යාත්මික පැත්තට නැඹුරුවීමක් එකල භාරතයේ පැවතුනා. නමුත් එසේ හුදකලා මාර්ගයක් අනුගමනය කරන්නන් සමඟ ඔබට කිසිම සම්බන්ධතාවයක් නැහැ. මෙහිදී භාර්යාවත් ස්වාමි පුරුෂයාත් දෙදෙනාම පාරිශුද්ධත්වයට පත්විය යුතුයි. රෝද දෙකම හොඳින් කැරකෙනවා නම් එය නිවැරදියි. එසේ නැත හොත් එහි නොයෙකුත් ගට්ටනයන් ඇති වෙනවා. පාරිශුද්ධත්වය මත තමයි මේ සියලු ගට්ටනයන් හට ගන්නේ. වෙන කිසිම සත්සන් පන්තියක පාරිශුද්ධත්වය නිසා මෙවන් ප්‍රහේළිකා හට ගන්නා බවක් ඔබ මීට පෙර අසා නැතිව ඇති. නමුත් මෙම ප්‍රශ්න හටගන්නේ බාබා පැමිණි විට එක් වතාවක් පමණයි. ඒ සන්යාසීවරු කියනවාද අහිංසක අය නිතරම වද විඳිනවා කියලා ? නැහැ. මෙහිදී මේ දූප්පත් දැරියන් කෑ ගසනවා බාබා, මා බේරා ගන්න! කියා. බාබා කියනවා රාගය තමයි ඔබගේ පරම හතුරා. එම නිසා ඔබ කිසිම විටෙක එයට ගොදුරු නොවිය යුතුයි. මිනිසුන් රාගය නිසා සම්පූර්ණයෙන්ම පහත බසිනවා. රාගය නැමැති පාපය සතයක් හෝ නොවටිනා දුර්ගුණයක්. බාබා කියනවා ඔබ මෙම ගණිකා මඩම නැමැති දුක් ලෝකයේ උපත් 63ක් තිස්සේ වාසය කරමින් සිටිනවා. නමුත් දැන් ඒ ස්වර්ණම යුගය (ශිවාගේ කෝවිල) කරා යාමට නම් ඔබ පාරිශුද්ධත්වයට පත් විය යුතුයි. මේ උපත සඳහා පමණක් පාරිශුද්ධත්වයට පත්වන්න. ශිව බාබා සිහි කරන්න. එවිට ඔබ අනිවාර්යෙන්ම ඔහුගේ කෝවිල වෙත ගියා සමානයි. කෙසේවෙතත්, මෙම රාගය නැමැති පාපය නම් බොහෝ බලවත්. එහි ආකර්ෂනය නිසා බොහෝ දුක් වේදනා විඳීමට ඔබට සිදු වෙනවා. නමුත් ඔබ දැන් එම ආකර්ෂන වලින් ඔබ්බට පැමිණිය යුතුයි. මන්ද, දැන් ඔබ ඔබගේ නිවස කරා යාමටයි සූදානම් වන්නේ. ඔබ අනිවාර්යෙන්ම පාරිශුද්ධත්වයට පත් විය යුතුයි. ඔබගේ ගුරුවරයා මෙහි රැඳී සිටින්නේ නැහැ. මෙම අධ්‍යාපනය පවතින්නේ කෙටි කාලයක් තුළ පමණයි. බාබා ඔබට විස්තර කරනවා මෙය තමයි මගේ වාහනය. එමනිසා, මෙම වාහනයේ ආයු කාලය එතරම් දීර්ඝ වන්නේ නැහැ. බාබා කියනවා මම සැමදාම සදාකාලිකයි.

මා හඳුන්වන්නේ අමරණීයත්වයේ නායකයා ලෙසයි. මා කිසිවිටෙක නැවත උපත් ලබන්නේ නැති නිසා තමයි එසේ හඳුන්වන්නේ. කල්ප භාගයක් සඳහා මා ඔබ අමරණීයත්වයට පත් කළත් ඉන් පසු නැවතත් ඔබ උපත් ගත යුතුයි. ඉතින් දරුවනි, ඔබ සියලුම දෙනාම දැන් ඒ ඈත දනව්ව කරා යා යුතුයි. ඔබගේ දෙපා මෙම දිශාවේ තිබුණා වුවත් ඔබගේ මුහුණ තිබිය යුත්තේ එම දිශාවේමයි. එසේ නම් ඇයි ඔබ මුහුණ වැරදි දිශාවට හරවන්නේ ? ඔබ සමහර අවස්ථාවල දී කියනවා බාබා මම වැරදි දිශාවක සිටිය නිසා මේ මේ වැරැද්ද කළා කියලා. ඒ කියන්නේ ඔබ ඔබව උඩුබෙලි අතට හරවාගෙන තිබෙන බවයි. ඔබ බාබා අමතක කර ශරීර අවධානයට පත් වුණු විට ඔබ එසේ උඩුබෙලි අතට හැරෙනවා. බාබා ඔබට සියලු දේ විස්තර කර දී තිබෙනවා. ඔබ කිසිම දෙයක් බාබාගෙන් ඉල්ලීමට අවශ්‍ය වන්නේ නැහැ. මට බලය දෙන්න, මට ශක්තිය දෙන්න ආදී වශයෙන් බාබාගෙන් යදින්න එපා. මෙම තත්ත්වයට පත්වීම සඳහා බාබා ඔබට මාර්ගය පෙන්වා දී තිබෙනවා. ඒ තමයි ස්මරණය. යෝග බලය මඟින් උපත් 21ක් යන තුරු ඔබ කිසිම දෙයක් කිසිම කෙනෙකුගෙන් යැදිය නොයුතු අවස්ථාවට ඔබ පත් වෙනවා. බාබාගෙන් ඔබට මෙතරම් දෙයක් ලැබිය හැකියි. බාබා ඔබට ලබා දෙන ආදායම අප්‍රමාණයි. ඔහු කියනවා ඔබට අවශ්‍ය තරම් ලබා ගන්න. ලක්ෂ්මී හා නාරායන් තමයි උසස්ම දෙදෙනා. එමනිසා, ඔබට අවශ්‍ය ඕනෑම දෙයක් ලබා ගන්න. ඔබ සම්පූර්ණයෙන්ම මෙම අධ්‍යාපනය නොකළ හොත් ඔබට සේවකයෙක් විය හැකියි. එවැනි සේවකයිනුත් එහිදී අනිවාර්යෙන්ම අවශ්‍ය වෙනවා. ඔබ මෙසේ දිගින් දිගටම දියුණු වේගෙන යන විට ඔබට කෞතුකාගාර පමණක් නොව ඔබ විසින් සේවය සිදු කරන නොයෙකුත් ශාලා හා විද්‍යාලයන් ඇරඹේවි. මංගල උත්සවය සඳහා තනන ශාලා අනිවාර්යෙන්ම ඔබට ලැබෙනවා. ඒවායෙහි අධිපතීන් හට ඔබට කිව හැකියි ඔහු මෙන්ම ඔබත් පාරිශුද්ධත්වයට ලක් කිරීමට ශිව බාබා හට පුළුවන් කියා. එවිට ඔවුන් එම ශාලා ඔබට දීමට කැමති වෙනවා. ඔවුන්ට කියන්න දෙවියන් කියන්නේ රාගය යනු ඔබගේ බලවත්ම හතුරා එම පාපය තමයි ඔබගේ දුකට හේතු වන්නා වූ මූල්ම කරුණ කියලා. දැන් ඉතින් පාරිශුද්ධත්වයට පත් වී ඒ පිරිසිදු ලෝකය කරා යාමට සැරසෙන්න. ඔබට දිගින් දිගටම මෙසේ නොයෙකුත් ශාලා ආදිය ලැබෙයි. නමුත් ඒවා ලබාදෙන්නන් පවා ඒ වන විට පරක්කු වී වැඩියි. බාබා කියනවා මා මේ දෙන දෙයට කිසිම දෙයක් ඔබගෙන් බලාපොරොත්තු වන්නේ නැහැ. දැන් මෙම තටාකය දරුවන් විසින් දෙනු ලබන සෑම සතයකින්ම පිරී ඉතිරී ගොස් තිබෙන්නේ. ඔබට අයත් යැයි සිතාගෙන සිටිනා සියලු දේ දැන් දූවිලි බවට පත් වෙනවා. බාබා තමයි හොඳම ගබඩාකරුවා. ඔහු නියම මැණික්කරුවෙක්. ඒ වගේම රෙදි අපුල්ලන්නෙක් ඒ වගේම කර්මාන්තකරුවාත් වනවා. අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කාලයක් තිස්සේ නැති වී සිට මේ දැන් හමු වුණු ඔය දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. බාබා ඔබට විස්තර කරන සත්‍ය කතාන්දරයට සැළකිල්ලෙන් සවන් දෙමින් ඒ සෑම කරුණක්ම හොඳින් ධාරණය කර ගන්න. බාබාගෙන් කිසිම දෙයක් යදින්න එපා. උපත් 21ක් තිස්සේ භුක්ති විඳිය හැකි ආදායම බාබාගෙන් ලබා ගන්න.
2. ඔබ දැන් නිවස බලා යා යුතු කාලය පැමිණ තිබෙනවා. එමනිසා, යෝග බලය හොඳින් ලබාගෙන ශරීරයට ඇති සියලුම ආකර්ෂනයන් බිඳ හෙලන්න. ඔබගේ සියලුම ඉන්ද්‍රියන් සැහැල්ලු කර ශරීරයට ඇති අවධානය නැති කරන්න.

**වරදානය:** ආලෝකයෙන් හා ශක්තියෙන් පිරුණු අයෙක් වී එකම තැනක සිට ජීවාත්ම විශාල පිරිසකට සේවය කළ හැකි කෙනෙක් බවට ඔබ පත් වේවා.

ප්‍රදීපාගාරයක් එක් තැනක ඉඳ දුර ඈතට සේවය කරන්නාක් සේ. ඔබ සෑම කෙනෙකුටමත් එකම තැනක ඉඳිමින් දුර ඈතට සේවය කිරීමේ උපකරණ විය හැකියි. මේ සඳහා ඔබ කළ යුත්තේ ආලෝකයෙන් හා ශක්තියෙන් පිරි අයෙක් වීම පමණි. ඔබගේ මනස හා බුද්ධිය නිශ්ඵල සිතිවිලි වලින් මුදවා තබා ගන්න. මන්මනාභව මන්ත්‍රයේ ප්‍රතිමූර්තියක් වන්න. ඔබගේ මනස සුබ පැතුම් හා පිවිතුරු හැඟීම් වලින් පිරුණු උසස් ආකල්ප හා කම්පන පතුරුවන්නෙක් වුණු විට ම සේවය ඉතාමත් පහසුවෙන් කළ හැකි වේවි. මනසින් කළ හැකි සැබෑම සේවාව මෙයයි.

**පාඨය:** ඔය බ්‍රහ්මණ ජීවාත්ම දැන් බලගතු අය වී අන් ජීවාත්මයන්ව මයික්ස් කරවිය යුතුයි.

***** ඕම් ශාන්ති *****